# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,861 - 2014 මැයි මස 02 වැනි සිකුරාදා - 2014.05.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 659 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව

**ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2014 වර්ෂය**

2014 වර්ෂය සඳහා ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. (අ) වයස : 2014.03.31 වැනි දිනට අවුරුදු 16 ත් 22 ත් අතර විය යුතු ය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :
අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම.

*විශේෂ කුසලතා :*
විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරගවලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ජාතික මට්ටමේ තරගවලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහළ ජයග්‍රහණයක් ලබා ඇති අය ඉහත (ආ) සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් ය.

(ඇ) *සැ. යු.*—ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග වසර 03ක් හෝ වැඩි කාලයකට දැනට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකල යුතු ය.

2. පාඨමාලා මාධ්‍යය :-
සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පැවැත්වේ.

3. *ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණය.*—අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

(අ) පවත්වන මාධ්‍යය : සිංහල සහ දෙමළ භාෂාවලින්

(ආ) *විභාග මධ්‍යස්ථාන* : කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය, සහ වවුනියාව (ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථානවලින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් ආසන්නම මධ්‍යස්ථානයට යොමු කරනු ඇත.)

*විභාගයට අදාළ විෂයයන්.*—ඇතුලත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ කාර්මික ඇඳීම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

4. *විභාග ගාස්තු.*—විභාග ගාස්තු වශයෙන් රු. 400 ක මුදලක් ගෙවිය යුතු අතර, එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් පහත ගිණුමට බැර කර ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.

*ගිණුම.*—ගණකාධිකාරී, ''ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය, ලංකා බැංකුව, මොරටුව ශාඛාව, ගිණුම් අංක 681490''. විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුලත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. මූලික තෝරාගැනීම :

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රමුඛතා පදනම මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ.)

6. අවසන් තෝරා ගැනීම :

යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදු කරනු ඇත. ලකුණු ලබා දෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40%ක් ද, සම්මුඛ පරීක්ෂණය සඳහා 60%ක් ද වශයෙනි. විෂයය බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත්ව පුහුණුව සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතු ය.

7. පුහුණු පාඨමාලා :

| | |
|---|---|
| මෝටර් කාර්මික ශිල්පය | - අවු. 04 |
| මිල්රයිට් වැද්දුම් ශිල්පය | - අවු. 04 |
| වායු සමීකරණ/ශීතකරණ ශිල්පය | - අවු. 03 1/2 |
| බල විදුලි ශිල්පය | - අවු. 03 1/2 |
| යන්ත්‍රණ ශිල්පය | - අවු. 03 1/2 |
| ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | - අවු. 03 |
| වාහන විදුලි ශිල්පය | - අවු. 03 |
| පෑස්සුම් ශිල්පය | - අවු. 03 |
| මෝටර් වාහන, බොඩි අළුත් වැඩියාකරු හා පින්තාරුකරු | - අවු 03 (බොරැල්ල ශාඛාව) |

මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙනුයේ ප්‍රථම වසරේ දී මූලික පුහුණු පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තීය තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවන්ගේ ප්‍රතිඵල අනුවය.

8. ගිවිසුම් අත්සන් කිරීම :

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාළව අවු. 04,03 1/2 සහ 03ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග ගිවිසුමකට එළඹිය යුතු ය.

ඊට අමතරව ආයතනීය සාර්ථක පුහුණුවෙන් පසු අවශ්‍ය වුවහොත් වසර 02ක් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවය සඳහා යොමු කරනු ඇත.

9. අයදුම්පත් :
පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයට තම අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය;

(ආ) අධ්‍යාපන සහතික;

(ඇ) ඉහත අංක 1 හි විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් නිකුත් කර ඇති පළාත්/ජාතික මට්ටමේ සහතිකය,

අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ "පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2014" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(අයදුම්පත් www. (cgtti.lk දරන ආයතනීය වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය.)

10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :
අයදුම්පත් 2014.06.20 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන වෙත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

11. විභාග ප්‍රවේශපත්‍ර :
සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාළ විභාග ප්‍රවේශපත්‍ර 2014.08.09 දින වනවිට ලැබීමට සලස්වන අතර ප්‍රවේශපත්‍ර නොලැබුණු අයදුම්කරුවන් පහත දුරකථන අංකයෙන් විමසිය යුතු ය.

කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන
ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය.

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය,
අංක 582, ගාලු පාර, ගල්කිස්ස,
(අඟුලාන හංදිය අසල)
දුරකථන අංකය : 0112-605625.

*ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව*

*ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2014 වර්ෂය*

01. (අ) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.
(ඉංග්‍රීසියෙන්) :————.

(ආ) මුලකුරු සමග නම :————.

02. (අ) තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.

(ආ) දිස්ත්‍රික්කය :————. (ඇ) පළාත :————.

03. (අ) උපන් දිනය :————.

(ආ) 2014.03.31 දිනට වයස : අවු. :————. මාස :———. දින :————.

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :————.

(ඈ) දුරකථන අංකය :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

05. අධ්‍යාපන සුදුසුකම් (අ. පො. ස. සාමාන්‍ය පෙළ) :

දෙවන වර (විශේෂ කුසලතා යටතේ ඉදිරිපත් වන අයදුම්කරුවන් සඳහා පමණි.)

| විභාග අංකය : *විෂයයන්* | වර්ෂය : *සාමාර්ථය* | විභාග අංකය : *විෂයයන්* | වර්ෂය : *සාමාර්ථය* |
|---|---|---|---|
| .................... | ...... | .................... | ...... |
| .................... | ...... | .................... | ...... |
| .................... | ...... | .................... | ...... |
| .................... | ...... | .................... | ...... |
| .................... | ...... | .................... | ...... |
| .................... | ...... | .................... | ...... |
| .................... | ...... | .................... | ...... |
| .................... | ...... | .................... | ...... |
| .................... | ...... | .................... | ...... |

06. විශේෂ දක්ෂතා යටතේ අයදුම් කරන්නේ නම් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම මගින් නිකුත් කළ පළාත්/ජාතික මට්ටමේ සහතිකය නිකුත් කළ වර්ෂය හා ක්ෂේත්‍රය :————.

07. (අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය :————.
(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය :————.
(කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය හා වවුනියාව)

08. (i) මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම :————.
(ii) මුදල් ගෙවූ දිනය :————.

09. ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් විස්තරවලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මා තෝරා ගැනීමට පෙර හෝ තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හැකි බව දනිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

05-02

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු 111 ශ්‍රේණියේ තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. *අයදුම්පත් භාර ගැනීම.* - මෙම ගැසට් නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව 'ඒ 4' ප්‍රමාණයේ (සෙ.මී. 21x29) කඩදාසි වල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින් අයදුම්පත් සකස් කර ගත යුතු ය. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 4.0 තෙක් පළමුවන පිටුවට ද, 5.0 සිට 7.0 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවටද වන ලෙස පිළියෙල කර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුලත් කල යුතු ය.ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත. තව ද ආදර්ශ අයදුම්පත්‍රය පිළියෙල කිරීමේ දී අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද , දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ. අපේක්ෂකයා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත, 2014.05.20 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, 230, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(අ) අයදුම්පත් එවීමේ දී ''ගබඩා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2014'' යනුවෙන් අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කළ යුතු ය.

(ආ) රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් නියමිත දිනට පෙර එවිය යුතු ය.

(ඇ) අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්පත් හෝ ඊට සම්බන්ධ වෙනත් ලියවිල්ලක්, තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

(ඈ) අදාළ ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ හා ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. *අනන්‍යතාවය.*- විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

4. *සාවද්‍ය තොරතුරු.* - අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. අපේක්ෂකයකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව අනාවරණය වුවහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ඇත.

5. *මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය.*- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(iv) අනුව MN1-2006(A) රු.13,120-10 x1 45-11 x170-10 x 240-10 x 320-රු. 22,040/- වන අතර වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන අනුවය. තනතුරට පත්වීමෙන් පසු හතරවන වැටුප් පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

6. වයස් සීමාව. - අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

7. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්කිරීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත්වේ.
2009.02.20 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද අංක 1589/30 දරන කාර්යය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළ ලබාගත යුතු ය.

III. සාමාන්‍ය කාර්යාලයීය ගබඩා භාණ්ඩ හා දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් වැඩබිම් හා ව්‍යාපෘතීන්ට අදාළ යන්ත්‍රෝපකරණ, ඉංජිනේරුමය ද්‍රව්‍ය භාරයේ තබාගැනීම විධිමත් පරිදි නිකුත් කිරීම තනතුරට අදාළ රාජකාරි වේ.

IV. දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් වැඩබිම් ආශ්‍රිත කාර්යාල ප්‍රවාහන පහසුකම් අඩු දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇත. ව්‍යාපෘති රාජකාරි හා ගංවතුර වැනි හදිසි ආපදා අවස්ථාවන්හි සේවා අවශ්‍යතාව මත දිවා රාත්‍රී සේවය අනිවාර්යය වේ.එම සේවා ස්ථාන අම්පාර, පොතුවිල්, කල්මුණේ, අක්කරපත්තු, පදවිය, රාජාංගනය, හුරුළුවැව, මාපාකඩ, බදුල්ල, කන්දකැටිය, නවකිරි, රුගම්, තිස්ස, වීරකැටිය, හම්බන්තොට, ලුණුගම්වෙහෙර, වැල්ලවාය, බිබිල, මොනරාගල, පොළොන්නරුව, කවුඩුල්ල, ඇලහැර, ඉගිනිමිටිය, පුත්තලම, මුතූර්, කන්තලේ, ගෝමරන්කඩවල, මුරුන්කන්, වවුනියාව යන වාරිමාර්ග කොට්ඨාස සහ ව්‍යාපෘති කාර්යාල වේ.

8. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-
(i) අධ්‍යාපන සුදුසුකම් :

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අ.පො.ස.(සා/පෙළ) විභාගය සමත්වී තිබීම ;

සහ

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

(ii) කායික සුදුසුකම් :
ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

වෙනත් :
(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය. ;
(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය. ;
(ඇ) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

(ඈ) ඉහත 8(1)(අ)(ආ) සුදුසුකම්වලට අමතරව පරිවාස කාලය තුලදී ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය මගින් පවත්වන ගබඩාකරණය පිළිබද මාස තුනක (3) පුහුණුව සාර්ථකව හදාරා තිබීම තනතුරේ ස්ථිර කිරීමට අවශ්‍ය සුදුසුකමක් වේ.

09. අයදුම්කරුවන් විසින් මෙහි පහත දැක්වෙන ලියකියවිලි වල මුල් පිටපත් අවශ්‍ය අවස්ථාවකදී ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර තබාගත යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්

10. *පත්වීම සඳහා තෝරාගනු ලබන අන්දම.*- මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකි. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සමත් අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු ලබාගත් අනුපිළිවෙලට තෝරාගනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.)
මෙම විභාගය 2014 ජූලි මස කොළඹදී පමණක් පවත්වනු ලැබේ.

11. තෝරා ගැනීමේ ක්‍රමය :
ලිඛිත විභාගය

| *ප්‍රශ්න පත්‍රය* | *ලකුණු* | *සමත් ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 | පැය 1 |

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නාවලියකින් යුක්තය.

12. *විභාගයට පෙනී සිටීම.* - විභාගය පැවැත්වෙන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුනගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය.
අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් පල කරනු ඇත. නිවේදනය පලවී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, ඒ බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත්ද, ලියාපදිංචි කළ කුවිතාන්සියද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද සමග විමසීම වඩාත් ඵලදායී වනු ඇත.

13. විභාග අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, රාජ්‍ය සේවයේ මාණ්ඩලික තනතුරක් දරණ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

14. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන සියළුම නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

15. මෙම විභාගය පැවැත්වීම, පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියළුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

***සටහන*** - මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පළවී ඇති නිවේදන අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල මාධ්‍ය බල පැවැත්විය යුතු බව කරුණාවෙන් සලකන්න.

ඉංජි. හද්‍රා කමලදාස,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2014 අප්‍රේල් මස 25 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි) [ ]

ආදර්ශ අයදුම්පත්‍රය
වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

The Open Competitive Examination for the Recruitment to the Post of Store Keeper (Grade III) in the Irrigation Department - 2014

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය:
සිංහල - 1
දෙමළ - 2 [ ]

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා: Perera A.B.C') :———.
1.2 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :————.
(සිංහලෙන් / දෙමළෙන්)
1.3 මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.4 මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන් / දෙමළෙන්)
1.5 ජාතික හැඳුනුම්පත් අංකය [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
1.6 ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
ස්ත්‍රී 1
පුරුෂ 2 [ ]

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන් / දෙමළෙන්)
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :
(1) සිංහලෙන්/දෙමළෙන් :————.
(11) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
2.4 දුරකථන අංකය :————.

3.0 පදිංචිය :————.
3.1 පදිංචි දිස්ත්‍රික්කය :————.
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

4.0 4.1 විවාහක/අවිවාහක බව :
විවාහක - 2 අවිවාහක - 1 [ ]

4.2 උපන් දිනය :————————.

අදාළ කොටුව තුළ ලියන්න.

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

4.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :————————.

අවුරුදු | | | මාස | | | දින | | |

4.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින්ද ? ලියාපදිංචි වීමෙන්ද? :————————.

5.0 අධ්‍යාපන සුදුසුකම් :————————.

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය :————————.

1. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :————————.

මාසය :————————.

11. විභාග අංකය :————————.

111. ප්‍රතිඵල :————————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය :————————.

1. විභාගයේ වර්ෂය හා මාසය:————————. වර්ෂය :————————.

මාසය:————————.

11. විභාග අංකය:————————.

111. ප්‍රතිඵල:————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

6.0 ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේද? (අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න.)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න.......................

7.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තවද මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූරණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීති වලට අනුකූලව ක්‍රියා කිරීමටත්, මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයක් පිළිගැනීමට මම එකඟ වෙමි.

(ඇ) ................ ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————————

අයදුම්කරුගේ අත්සන

දිනය :————————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................... මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............................ වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————————

අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

දිනය :————————.

සහතික කරන නිලධාරියාගේ නම :————————.

තනතුර :————————.

ලිපිනය :————————.

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
(දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණක් අදාළ වේ.)

.......................මයා/මිය/මෙනවිය ..........................සේවයේ නියුතු ..............................තනතුර දරණ නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත්, ................................ සේවයෙන් ඔහු/ඇය මුදාහැරිය හැකි/නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

————————

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :————————.

05-266

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

B2 - B80798

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| මැයි | 2014.05.02 | සිකුරාදා | 2014.04.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2014.05.09 | සිකුරාදා | 2014.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.16 | සිකුරාදා | 2014.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.23 | සිකුරාදා | 2014.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.30 | සිකුරාදා | 2014.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2014.06.06 | සිකුරාදා | 2014.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.13 | සිකුරාදා | 2014.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.20 | සිකුරාදා | 2014.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.27 | සිකුරාදා | 2014.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2014.07.04 | සිකුරාදා | 2014.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.11 | සිකුරාදා | 2014.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.18 | සිකුරාදා | 2014.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.25 | සිකුරාදා | 2014.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ජී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

B2 - B 080826